# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1776 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 29/11/2024<br>පැය 1205 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. කේරළ ගංජා සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.11.28 වන දින උදෑසන කාලයේ මුන්දලම පොලිස් වසමේ කොළඹ පුත්තලම මාර්ගයේ නවදන්කුලම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **කේරළ ගංජා කිලෝ 15 ග්‍රෑම් 83 ක් කාර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු කාර් රථයද සමඟින්** අත්අඩංගුවට ගෙන මුන්දලම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 38 හා 42 වයස්වල පසුවන මංගලඑළිය හා මදුරන්කුලිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මුන්දලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ බුද්ධි කොට්ඨාසය.**

2024.11.28 වන දින සවස් කාලයේ පයාගල පොලිස් වසමේ කලමුල්ල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 201 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන කලමුල්ල, කළුතර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෙම සැකකරු මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු හා සංවිධානාත්මක අපරාධකරුවෙකු බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර කළුතර, පයාගල හා කටුකුරුන්ද ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් මහා පරිමාණයේ හෙරොයින් හා අයිස් මත්ද්‍රව්‍ය ජාවාරම්වල නිරත වෙමින් ප්‍රදේශයේ ව්‍යාපාරිකයින් හා මහජනයා බිය වැද්දීම් සිදුකර මරණීය තර්ජන එල්ල කරමින් කප්පම් මුදල් ලබාගත් පුද්ගලයෙක් බවටද අනාවරණය වී ඇත.

තවද මෙම සැකකරු දකුණු හා බස්නාහිර පළාත් වල සිදු වූ වෙඩි තබා මනුෂ්‍ය ඝාතන කිහිපයකට සම්බන්ධ සැකකරුවෙකු බවට අනාවරණය වන අතර මීට පෙර විෂ මත්ද්‍රව්‍ය, පුපුරණ ද්‍රව්‍ය, තියුණු ආයුධ වලින් කපා කොටා බරපතල තුවාල සිදුකිරීම හා මනුෂ්‍ය ඝාතන සිදුකිරීම සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමෙන් පසු ඇප මත මුදා හැර සිටි පුද්ගලයෙකු වේ.

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. කොකෝන් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.11.28 වන දින සවස් කාලයේ බොරැල්ල පොලිස් වසමේ සර්පන්ටයින් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **කොකේන් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 255 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. විදුලි සැර වැදී අඹුසැමි යුවලක් මියයාම - මුන්දලම පොලිස් වසම.

2024.11.28 වන දින සවස් කාලයේදී මුන්දලම පොලිස් වසමේ අක්කර 412 ප්‍රදේශයේදී නිවසක් තුළ විදුලි සැර වැදී පුද්ගලයෙකු හා කාන්තාවක් මියගොස් ඇති බවට මුන්දලම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 52 ක් හා මරණකරු වයස අවුරුදු 55 ක් වූ අක්කර 412, මුන්දලම ප්‍රදේශයේ පදිංචි අඹුසැමි යුවලකි.**

නිවසට යොදන ලද අනවසර විදුලි රැහැනක ගැටී විදුලි සැර වැදීමෙන් මෙම අඹුසැමි යුවල මියගොස් ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීර පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මුන්දලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. සැකකටයුතු මරණයක් - උහන පොලිස් වසම.

2024.11.27 වන දින සවස් කාලයේදී උහන පොලිස් වසමේ ගලපිටගල ප්‍රදේශයේ කාන්තාවක් විසින් තම ඥාති පුත්‍රයෙකු අතුරුදහන් වී ඇති බවට කරන ලද පැමිණිල්ලක් මත උහන පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

අතුරුදහන් වූ පුද්ගලයා එදින වෙළඳසැලකට යන බව පවසා යතුරුපැදියකින් පැමිණි පුද්ගලයෙකු සමඟ නිවසින් පිටව ගොස් ඇත. 2024.11.28 වන දින උහන පොලිස් ස්ථානය වෙත කේ.සී.කොළණිය ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු

මියගොස් සිටින බවට පොලිස් ස්ථානය දැනුවත් කිරීමෙන් පසු වැඩිදුර විමර්ශනයේදී මිය ගොස් ඇත්තේ අතුරුදහන් වූ පුද්ගලයා බවට අනාවරණය වී ඇත.

**මරණකරු වයස අවුරුදු 25 ක් වන ගලපිටගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරික්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරික්ෂණය සඳහා අම්පාර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර උහන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**